# කාර්ය සාධන වාර්තාව

# 2016

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

# පටුන


| පටුන | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 01 |
| දැක්ම | 02 |
| මෙහෙවර | 02 |
| කාර්යයන් | 03 |
| නිමැවුම | 03 |
| කාර්ය මණ්ඩලය | 03 |
| තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 05 |
| සේවා වැඩිදියුණු කිරීම | 06 |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 06 |
| 2016 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කළ රෙගුලාසි | 09 |
| ආදායම් විශ්ලේෂණය - 2016 | 15 |
| ආදායම - 2016 | 16 |
| වියදම් විශ්ලේෂණය - 2016 | 16 |
| පුනරාවර්තන වියදම හා මූලධන වියදම | 16 |
| මූල්‍ය ප්‍රභවයන් | 17 |
| ආදායම් හා වියදම් විශ්ලේෂණය | 18 |
| පසුගිය වසර 5 තුළ බලපත්‍ර සංඛ්‍යාව සහ ඉපැයූ ආදායම | 19 |
| පසුගිය වසර 5 තුළ ආදායම සහ බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 20 |
| ඇමුණුම 01 - සංවිධාන සටහන | 22 |

# ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1969 අංක 1 දරන පනතින් පිහිට වූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මේ වර්ෂය වන විට පුරාවසර 47 ක් තම මෙහෙවර ජාතිය වෙනුවෙන් ඉටුකර ඇත. ආනයන හා අපනයන පාලනය කිරීමේ අරමුණ පෙරදැරිව මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළද වර්තමානය වන විට ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදකයෙකුගේ කාර්යයද ඉටු කරනු ලබයි.

ඒ අනුව ජාත්‍යන්තර වෙළඳාමට අදාල ආනයන අපනයන රෙගුලාසි පිළියෙල කිරීමද, ආනයන අපනයන සඳහා පහසුකම් සැපයීම හා ප්‍රවර්ධන කටයුතු ඉටු කිරීමද දක්වා අදාළ කාර්යභාරය පුළුල් වී ඇත. ඒ අනුව, ජාතික ආරක්ෂාවට අදාල කටයුතු ඉටු කිරීම ද මහජන සුභසිද්ධිය, පරිසරය හා මහජන සෞඛ්‍ය සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම ද යන මූලික අභිමතාර්ථ පෙරදැරිව අදාළ කටයුතු ඉටු කරනු ලැබේ.

තවද, ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සුරක්ෂිත වන පරිදි අපනයන භාණ්ඩ සඳහා ප්‍රමිතිකරණයක් හඳුන්වාදීම ද මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අතරට වැටේ. ඊට අමතරව විනිමය පාලන දෙපාර්තමේන්තුව සමග එක් වී විනිමය පාලන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික පියවර ගැනීමද නව ප්‍රවණතාවයකි.

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද බාසල්, ස්ටොක්හෝම් සහ රොටර්ඩෑම් වැනි ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගතව ආනයන හා අපනයන නියාමනය සඳහා පියවර ගෙන ඇත. එසේම, පරිසරයට හා මහජන සෞඛ්‍යට අහිතකර වන්නා වූ ග්ලයිපොසේට් වැනි රසායනික ද්‍රව්‍ය ආනයනය පාලනය හෝ තහනම් කිරීම සඳහා පියවර ගෙන ඇත. ආනයනය කරනු ලබන ඖෂධ සඳහා 2/3ක ජීව කාලය අනිවාර්යය කිරීම, කල් ඉකුත් වූ ඖෂධ ආනයනය වැලැක්වීමට ගත් වැදගත් පියවරකි.

ශ්‍රී ලංකාව සේද මාවතේ ඉන්දියන් සාගරයේ ඉතා විශේෂිත ස්ථානයක පිහිටා ඇති බැවින් ජාත්‍යන්තර වෙළඳාම තුළ ඉතා සුවිශේෂී ප්‍රතිඅපනයන ස්ථානයක් ලෙස හඳුනා ගෙන ඇත. චීනය හා ඉන්දියාව විසින් අනුගමනය කරනු ලබන නව ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන් වලදී දේශීය වශයෙන් උසස් ප්‍රතිපත්ති රාමුවක් තිබීම ඉතා වැදගත් වේ. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පසුගිය වසර තුළ ආනයන හා අපනයන පාලනය සම්බන්ධව රෙගුලාසිමය වශයෙන් වැදගත් තීරණ ගෙන ඇති අතර ඒවා අප රටේ ජනතාවට හා ආර්ථිකයට සුභවාදීව බලපාන අයුරින් ද ජාත්‍යන්තර සම්මුතීන්ට හා ගිවිසුම්වලට එකගවන අයුරින්ද සකස්කර ඇත.

# දැක්ම

යහපත් අනාගතයක් උදෙසා පරිසරය හා මහජනතාව සුරක්ෂිත කිරීම

# මෙහෙවර

රටේ ආරක්ෂාව,ආර්ථිකය,මහජන සෞඛ්‍යය,පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

## කාර්යයන්

- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම.
- ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම මගින් ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධ කරුණුවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා වාණිජ බැංකු වලට සහාය වීම.
- ආනයන පාලන රෙගුලාසි සම්බන්ධ මෙහෙයුම් උපදෙස් වාණිජ බැංකුවලට නිකුත් කිරීම.

## නිමැවුම

- 2016 වර්ෂය තුළදී ආනයන හා අපනයන බලපත්‍ර 15498 ක ප්‍රමාණයක් පමණක් නිකුත් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වූ ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන බලපත්‍රයට අනුකූලව භාණ්ඩ ආනයනය කළේ ද යන්න තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු හර කිරීම් මගින් ආනයන පාලනය විධිමත් කිරීම.
- ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්ති මත විදේශ විනිමය වැය නොවන පදනම මත සිදු කරන ආනයනයන් සඳහා අවසර ලබා දීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලක වෙත අවශ්‍ය සහායන් ලබා දීම.
- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට මෙහෙයුම් උපදේශන නිකුත් කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ගාස්තු වශයෙන් රුපියල් මිලියන 1370 ක ආදායමක් එක්රැස් කර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

## කාර්ය මණ්ඩලය

ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම, හර කිරීම හා ආදායම් එක්රැස් කිරීමේ කාර්යයන් මෙන්ම සාමාන්‍ය කාර්යාල පරිපාලන කටයුතු සහ ප්‍රතිපත්ති හා සැලසුම් කාර්යයන් සඳහා පහත කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවන ලදී. (වගුව අංක 01)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවාවන් ඉහළම කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාමටත්, සේවාදායකයින්ට ඵලදායී කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් සැපයීමටත් මෙම කාර්ය මණ්ඩලය වර්ෂය මුළුල්ලේම වගකීමෙන් යුතුව සාමූහිකව ක්‍රියාකරන ලදී.

වගුව අංක 01

| අනු අංකය | තනතුර | වැටුප් ක්‍රමය | සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2016.12.31 දිනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | ආනයන හා අපනයන පාලක ජනරාල් | SL3 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - විශේෂ | 1 | 1 | 0 |
| 2 | ආනයන හා අපනයන පාලක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - I | 1 | 1 | 0 |
| 3 | සහකාර/නියෝජ්‍ය පාලක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - II/III | 7 | 4 | 3 |
| 4 | ගණකාධිකාරි | SL1 - 2016 A | ශ්‍රී.ලං.ග.සේ - II/III | 1 | 1 | 0 |
| 5 | අභ්‍යන්තර විගණක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ග.සේ - II/III | 1 | රාජකාරී ආවරණය කරයි | 1 |
| 6 | පරිපාලන නිලධාරි | MN7 - 2016 A | රා.ක.ස.සේ - අධි පන්තිය | 1 | 1 | 0 |
| 7 | භාෂා පරිවර්ථක | MN6 - 2016 A | භාෂා පරිවර්ථක සේවය | 2 | - | 2 |
| 8 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | MN6 - 2016 A | ශ්‍රී.ලං.තොරතුරු තාක්ෂණ සේවය | 1 | 2 | 0 |
| 9 | විමර්ශන සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 2 | 2 | 0 |
| 10 | පර්යේෂණ සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 1 | 0 |
| 11 | ප්‍රතිපත්ති හා සැලසුම් සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 1 | 0 |
| 12 | තොරතුරු තාක්ෂණ නිලධාරි | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 1 | 0 |
| 13 | දත්ත කළමනාකරණ සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 1 | 0 |
| 14 | අයවැය සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | - | 1 |
| 15 | සංවර්ධන නිලධාරි | MN4 - 2016 A | සංවර්ධන නිලධාරි සේවය - I/II/III | 4 | 2 | 2 |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර | MN2 - 2016 A | රා.ක.ස.සේ - I/II/III | 57 | 48 | 9 |
| 17 | රියදුරු | PL3 - 2016 A | රියදුරු සේවය | 5 | 5 | 0 |
| 18 | කාර්යාල සේවක සේවය | PL1 -2016 A | කා.සේ.සේ. - I/II/III | 15 | 7 | 8 |
| එකතුව | | | | **103** | **78** | **26** |

**2016.12.31 දිනට කාර්ය මණ්ඩලය** වගුව අංක 02

| අනු අංකය | තනතුරු නාමය, සේවය හා පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය සේවක සංඛ්‍යාව | වෙනස/අතිරික්කය /පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | මාණ්ඩලික සේවය | 12 | 08 | 04 |
| 02 | මාණ්ඩලික නොවන | 71 | 57 | 14 |
| 03 | කනිෂ්ඨ ශ්‍රේණිය | 20 | 12 | 08 |
| | | | | |
| | **එකතුව** | **103** | **77** | **26** |

## තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය

2014 වර්ෂයට පෙර කාලය සැලකූවිට ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා දින දෙකක කාලයක් ගත විය. එහෙත් 2014 වර්ෂයේ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළ අතර දෙපාර්තමේන්තුවේ කාර්යයන් එමගින් නව මාවතකට යොමු කරන ලදි. අදාළ ලියකියවිලි නිවැරදිව සපයන ඉල්ලුම්කරුවකු සඳහා ආනයන හා අපනයන පාලන බලපත්‍රයක් පැය දෙකකටත් අඩු කාලයකින් ලබාදීමට කටයුතු කර ඇත.

2016 වර්ෂයේ දී මෙම පරිසනක මෙහෙයුම් පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා පියවර ගෙන ඇති අතර ඒ සඳහා මූලික දත්ත සැකසීම් කටයුතු කරගෙන යනු ලැබීය. නව මෘදුකාංග පද්ධතිය මගින් ප්‍රධාන අරමුණු 3 ක් වෙත අවධානය යොමු කර ඇත

- බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගතවන කාලය අවම කිරීම
- ලේඛන හා නිර්දේශ වල විශ්වසනීයත්වය ආරක්ෂා කිරීම
- කාර්යක්ෂමතාවය ඉහළ දැමීම

දෙවන පියවර ලෙස මෘදුකාංග පද්ධතිය බාහිර ආයතනයන් හා සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ. විශේෂයෙන් බලපත්‍ර පාලනය හා නිකුත් කිරීම සම්බන්ධ ක්‍රියාවලිය තුළ ඊට බැඳී ඇති බාහිර ආයතන විශාල සංඛ්‍යාවක් පවතින බව හඳුනාගෙන ඇති බැවින් එම ආයතන හා සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගැනීම තුළින් ඉතා පුළුල් නිවැරදි කාර්යක්ෂම සේවාවක් සැපයීමට බලාපොරොත්තු වේ.

උදාහරණ වශයෙන්:

1. ශ්‍රී ලංකා රේගුව
2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
3. පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය

4. ජාතික ඖෂධ පාලන ඒකකය
5. ජාතික ඖෂධ නියාමන අධිකාරිය
6. ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය මෙම ආයතන හා සෘජුව සම්බන්ධ කිරීම තුළින් කාර්යක්ෂම සේවාවක් මෙන්ම අක්‍රමිකතාවලින් තොර පරිසරයක් නිර්මාණය කිරීමට අවකාශ ලැබෙන බව හඳුනාගෙන ඇත.

## සේවා වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ සේවාවන් උසස් තලයකට නැංවීම සඳහා දෙපාර්තමේන්තු ව්‍යුහයේ වෙනස්කම් සිදුකිරීම, ඉතා කාර්යක්ෂම පරිගණක පද්ධතියක් හඳුන්වා දීම, කාර්යමණ්ඩලයේ හැකියාවන් සහ කුසලතාවයන් ඔප් නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය සිදුකර ඇත.

අයදුම්පත් නිකුත් කිරීමේ සිට බලපත්‍රයක් නිකුත් කිරීම දක්වා සහ බලපත්‍ර හර කිරීම් නියාමනය කිරීමට හැකි ස්වයංක්‍රීය පරිගණකගත වැඩපිළිවෙළක් වෙත දෙපාර්තමේන්තුව යොමු වී ඇත. මෙයට අයපත් නිකුත් කිරීම ද ඇතුළත්වේ.

බලපත්‍ර නිකුත් කිරීමේ හා හර කිරීමේ තොරතුරු එසැණින් විද්‍යුත් මාර්ගයෙන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත සම්ප්‍රේෂණය කිරීමටත්, හර කිරීම් පිළිබඳ හර තොරතුරු රේගු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් පසු එම ක්‍රියාවලිය පහසු කිරීමටත් මෙම පරිගණනක පද්ධතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ කර ඇත.

පරිගණනක පද්ධතිය බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය සහ නිර්දේශ ලබාදෙන ආයතන හා සෘජුව සම්බන්ධ කෙරෙනු ලබන අතර, මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වීමෙන් පාරිභෝගිකයන්ට පහසු හා වේගවත් සේවාවක් ලබාදීමට හැකිවනු ඇත.

එමෙන්ම සේවාවන් ඉහළ නැංවීමට ගනු ලබන සෘජු හා වක්‍ර ක්‍රියාමාර්ග තුළින් ව්‍යාපාරික ප්‍රජාවට මෙන්ම පොදු මහ ජනතාවට සමාන හා අපක්ෂපාතී සේවාවන් සැලසීමට හැකි බව දෘශ්‍යමාන වන අතර, මේ වන විට දෙපාර්තමේන්තුවට ද එසේ නිවැරදි, කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැලසීමට හැකි වීඇත.

## පුහුණු කිරීම් හා හැකියා වර්ධනය

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර සේවාවන් ඉහළ කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායකත්වයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා 2016 වර්ෂය තුළදී පහත පරිදි දේශීය සහ විදේශීය පුහුණු සඳහා නිලධාරින් යොමු කර ඇත.

# දේශීය පුහුණු - සංවර්ධන නිලධාරී, රා.ක.ස/ කා.සේ.සේ

වගුව අංක 03

| අනු අංකය | ආයතනය | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු | වැය කළ මුදල |
|---|---|---|---|---|---|
| 01 | CIDA | රියදුරන් සඳහා විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම | 01 | 2016.03.01 | රු.3,000.00 |
| 02. | නිපුණතා පියස | තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය | 02 | 2016.03.14/15 | රු.17,000.00 |
| 03. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | බල ශක්ති සංරක්ෂණය හා ඇගයීම | 02 | 2016.04.05 | - |
| 04. | ප්‍රාග් ආයතනය | නිල බැංකු හා චෙක්පත් | 02 | 2016.04.07 | රු.12,000.00 |
| 05. | SLIDA | Advanced EXCEL | 01 | 2016.05.12/17 | රු.16000.00 |
| 06. | නිපුණතා පියස | කාර්යාල උපකරණ පිළිබඳ පාලනය | 02 | 2016.05.26/27 | රු.17,000.00 |
| 07. | ජාතික පුස්ත හා විඥාපන විද්‍යා ආතනය | පුස්තකාල මෘදුකාංග භාවිතය | 02 | 2016.06.15 | රු.10,000.00 |
| 08. | නිපුණතා පියස | පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව | 02 | 2016.06.20/21 | රු.17,00.00 |
| 09. | ප්‍රාග් ආයතනය | රාජකාරී ලිපි ලිවීම හා ලිපි ගොනු කරණය | 01 | 2016.07.12 | රු.6000.00 |
| 10 | නිපුණතා පියස | කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කරගනිමින් පැවැත්වූ පුහුණු වැඩසටහන | 03 | 2016.08.05./06 | රු.24,000.00 |
| 11. | ප්‍රාග් ආයතනය | වැටුප් කළමනාකරණය හා පරිවර්තනය | 01 | 2016.10.11 | රු.6000.00 |
| 12. | පරමාණු බලශක්ති නියාමන කොමිෂන් සභාව | National Training Course on " Nuclear or Radiological Emergency Preparedness & Response" | 02 | 2016.12.07/08/09 | - |
| 13. | | පොලික්ලෝරිනේට් බයිපිනයිල්ස් රසායනය භාවිතා කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | 03 | 2016.12.19 | - |
| 14. | Embassy of United States | International Dual use Investigation Programme | 02 | 2016.12.12 - 16 | - |
| 15. | SDFL | Work shop on " Role & Responsibilities of office Aids" | 01 | 2016.12.19/20 | - |

## දේශීය පුහුණු - මාණ්ඩලික

වගුව අංක 04

| අනු අංකය | ආයතනය | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු | වැය කළ මුදල |
|---|---|---|---|---|---|
| 01. | Cinnamon Lake Side Hotel | Follow up Seminar on Slida International Training Programme " Quality Infrastructure Development in Training Programme" | 01 | 2016.01.23 - 30 | - |
| 02. | Comfort International | Conflict Management & Negotiations for Managers & Executives | 02 | 2016.02.20 | රු.13,000.00 |
| 03. | Prag institute | Information System Audit | 01 | 2016.07.24 | රු.6,000.00 |
| 04. | මිලෝදා ආයතනය | Public Procurement Policy & Guidelines | 01 | 2106.08.26 | රු.6,750.00 |
| 05. | ප්‍රාග් ආයතනය | වැටුප් කළමණාකරණය හා පරිවර්තනය | 01 | 2016.10.11 | රු.6000.00 |
| 06. | SDFL | Stores Management & Purchasing Procedures | 01 | 2016.11.24/25 | රු.8,500.00 |
| 07. | SDFL | Workshop on Tax System & Taxation Proposals of the Budget -2017 | 02 | 2016.12.22 | රු.10,000.00 |
| 08. | Embassy of United States | International Dual use Investigation Program | 01 | 2016.12.12 - 16 | - |

## විදේශීය පුහුණු - සංවර්ධන නිලධාරී

වගුව අංක 05

| අනු අංකය | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු |
|---|---|---|---|---|
| 01 | චීනය | Seminar for Diplomats from South Asian Countries | 01 | 2016.11.02 – 2016.11.24 |

## විදේශීය පුහුණු - මාණ්ඩලික

වගුව අංක 06

| අනු අංකය | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු |
|---|---|---|---|---|
| 01 | චීනය | Seminar on Import Export Commodity Quality Inspection for Developing Countries | 01 | 2016.03.30 – 2016.04.23 |
| 02. | ඇමරිකා එක්සත් ජනපදය | Export Control and Related Boarders Security Programme | 01 | 2016.05.08- 2016.05.15 |
| 03. | චෙක් ජනරජය | 15th International Export Control Conference | 01 | 2016.11.02 – 2016.11.04 |
| 04 | බැංකොක් | Precursor Chemical Control for Asian Narcotics Law enforcement officers | 01 | 2016.11.21<br><br>2016.11.28 |

## 2016 වර්ෂය තුළ දී ප්‍රකාශයට පත් කළ නව රෙගුලාසි

ආනයනයන් හා අපනයනයන් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට පහත සඳහන් අතිවිශේෂ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කරන ලදී.

වගුව අංක 07

| අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ දිනය | අතිවිශේෂ ගැසට් පත්‍ර අංකය | අන්තර්ගතය |
|---|---|---|
| 11.02.2016 | 1953/27 | ජල නල උපාංග ශ්‍රී ලංකාවට ආනයනය පිළිබඳ රෙගුලාසි |
| 11.02.2016 | 1953/28 | ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු සංශෝධනය පිළිබඳ රෙගුලාසි |
| 07.06.2016 | 1970/9 | ආනයනය කරනු ලබන පාවිච්චි කළ වාහනවල ආයු කාලය හා ආරක්ෂක හිස් වැසුම් ආනයනය පිළිබඳ රෙගුලාසි. |
| 11.11.2016 | 1992/74 | ටින් මාළු හා මැකරල් ආනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීම පිළිබඳ රෙගුලාසි |

| | | |
|---|---|---|
| 30.12.2016 | 1999/47 | මොටර් වාහන ආනයනයට අදාල රේගු සංකේතාංක සංශෝදනය සහ කෘත්‍රිම ලිහිසිකාරක ආනයනය බලපත්‍ර පාලයනයට යටත් කිරීම පිළිබද රෙගුලාසි |
| | | කෘත්‍රිම ලිහිසිකාරක ආනයනය අපනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීම |

**අති විශේෂ ගැසට් අංක 1953/27 සහ 2016.02.11**
**ජල නල උපාංග ශ්‍රී ලංකාවට ආනයනය පිළිබද රෙගුලාසි**

- ශ්‍රී ලංකා රජය වර්ෂ 2025 දී මුළු රටටම සනීපාරක්ෂිත පානීය ජලය සැපයීමටත්, 2020 මුළු ජනගහනයෙන් 60% කට නළ ජලය සැපයීමටත් ප්‍රමුඛතාව දී සැලසුම් සකස් කොට ඇත.
- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ පානීය ජලය සැපයීමේ බලධාරියා වන අතර වර්තමානයේ පවුල් මිලියන 1.5 කට පමණ පානීය ජලය සපයනු ලැබේ. වර්ෂ 2020 වන විට මෙම ප්‍රමාණය 60% ක් දක්වා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දත්තවලට අනුව ජලය ඝන මීටර් 01 ක් නිපදවීම සඳහා රුපියල් 160 ක පමණ මුදලක් වැය වේ.
- කෙසේ වුවද පිරිසිදු කළ ජලය බෙදාහැරීමේදී හා ගෘහස්ථ මට්ටමේ ජලාපවහන පද්ධතිවල කාන්දුවීම් හේතුවෙන් විශාල ජල ප්‍රමාණයක් අපතේ යන බව නොරහසකි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ ගුණාත්මකභාවයෙන් අඩු ජලනල සවිකිරීම් උපාංග භාවිතය හා ප්‍රමිතියෙන් තොර ජලනල කාර්මික කටයුතු ය. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණනය කිරීම් අනුව ජල කාන්දුවීම් නිසා සිදුවන නාස්තිය දිනකට ජලය ඝන මීටර 250,000 ක් පමණ වේ.
- මේ අනුව සැලකීමේදී ජල නාස්තිය අවම කිරීමෙන් ඉතිරිවන විශාල මුදලක් තවදුරටත් නල ජලය ලබාදීමේ කටයුතු ව්‍යාප්ත කිරීම පිණිස භාවිතා කළ හැකිය.
- මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා තත්ත්වයෙන් උසස් ජලනල හා උපාංග භාවිතා කළයුතු අතර, ඒ සඳහා දේශීයව හා විදේශීයව නිෂ්පාදනය කරන ජලනල හා සවිකිරීමේ උපාංග වෙළඳපලට නිකුත් කිරීමට පෙර ප්‍රමිතිකරණයට යටත් කිරීම අවශ්‍ය වේ.
- ඉහත කරුණු සලකා තෝරාගත් ජලනල උපාංග කිහිපයක උසස් ප්‍රමිතිය, තත්ත්ව පාලනය සහ පිරිවිතර කිරීම සඳහා 2016.02.11 දිනැතිව අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරන ලදි.

- ඒ අනුව එකී 2016.02.11 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය 2016 මාර්තු 08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2016 ජුලි 22 දින පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන ලදි,

**අති විශේෂ ගැසට් අංක 1953/28 සහ 2016.02.11**
**ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු සංශෝධනය පිළිබඳ රෙගුලාසි**

- 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනතේ නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලද අයිතමයන් සඳහා බලපත්‍ර ගාස්තු නියම කළ යුතුය. ඒ අනුව 2007.10.08 දිනැතිව අංක 1518/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව බලපත්‍ර ගාස්තු අයකිරීම සිදුවිය.
- අනතුරුව 2015.06.18 දිනැතිව අංක 1919/49 දරන ගැසට් පත්‍රය මගින් එය සංශෝධනය කරන ලදි.
- පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් එකී ගැසට් පත්‍ර අදාළ කාලය තුළ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොහැකි විය.
- මේ හේතුවෙන් 2016.02.11 දිනැතිව අංක1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ගාස්තු නැවත ප්‍රසිද්ධියට පත් කරන ලද අතර, 2016 මාර්තු 09 දින පාර්ලිමේන්තුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2016 ජුලි 22 දින පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

**අති විශේෂ ගැසට් අංක 1970/09 සහ 2016.06.07**
**ආනයනය කරනු ලබන පාවිච්චි කළ වාහනවල ආයු කාලය හා ආරක්ෂක හිස් වැසුම් ආනයනය පිළිබඳ රෙගුලාසි**

- 2016 අයවැය යෝජනා අනුව යතුරුපැදි ධාවකයන්ගේ හා ධාවන තරඟ සඳහා භාවිතා කරන මෝටර් වාහනවල ධාවකයන්ගේ ආරක්ෂාව සලකා හිස්ආවරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදි. තවද, සංවර්ධන ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසනු වස් විශේෂ කාර්ය වාහන ගණයේලා සැලකෙන දොඹකර ලොරි සහ කොන්ක්‍රීට් මිශ්‍රකිරීමේ ලොරි රථවල ආනයනය සඳහා වලංගු වයස් සීමාව වසර 7 සිට 10 දක්වා ඉහළ නංවන ලදි. මෙම තීරණ අනුව හිස්ආවරණ බලපත්‍ර පාලනයට ලක්කළ යුතුවූ අතර, විශේෂ කාර්ය

වාහන ආනයනය සම්බන්ධයෙන් පැවති ආනයන රෙගුලාසි වසර 07 සිට 10 දක්වා සංශෝධනය කළ යුතු විය.

- ආදායම් සංරක්ෂණ නියෝග සඳහා වූ සංශෝධන අනුව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8702 යටතේ ගැනෙන මගීන් ප්‍රවාහනය සඳහාවූ මෝටර් වාහන වල, ආනයනය සඳහා වන වලංගු වයස් සීමාව මුල් ලියාපදිංචියේ සිට වසර 05 සිට වසර 10 දක්වාත්, 8703 යටතේ ගැනෙන වාහනවල එම වයස් සීමාව මුල් ලියාපදිංචියේ සිට වසර 02 සිට වසර 03 දක්වාත් දීර්ඝ කරන ලදි. ඒ අනුව, පැවති ආනයන පාලන රෙගුලාසි සංශෝධනය කරමින් 8702 යටතේ ගැනෙන වාහන වසර 10 ඉක්මවන අවස්ථාවේදි ද, 8703 යටතේ ගැනෙන වාහන වසර 03 ඉක්මවන අවස්ථාවේදීද ආනයන බලපත්‍ර පාලනයට යටත් කරමින් අංක 1903/41 හා 2015.02.26 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය නිකුත් කරන ලදි. එසේවුවද, එය ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන ප්‍රකාරව මසක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය.
- ඒ අනුව ඉහත පළමු හා දෙවන ඡේදයේ දක්වන ලද යෝජනා ක්‍රියාත්මක කරමින් 2016.06.07 දින අංක 1970/09 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රසිද්ධියට පත්කරන ලදි. එම අතිවිශේෂ ගැසට්පත්‍රය ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය සඳහා 2016 ජුලි 01 දින ඉදිරිපත් කල අතර 2016 ජුලි 22 දින පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇත.

**අති විශේෂ ගැසට් අංක 1992/74 සහ 2016.11.11**
**ටින්මාළු හා මැකරල් මසුන් ආනයනය පිළිබඳ රෙගුලාසි**

- මෙට්‍රික් ටොන් 20000 ක් වන වාර්ෂික ටින්මාළු අවශ්‍යතාවය සපුරාලීම සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 5ක පමණ විදේශ විනිමය වැයකරනු ලබයි. මේ හේතුව නිසා දේශීය ටින්මාළු නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ටින්මාළු සඳහා විශේෂ ආනයන බද්දක් පැනවීම 2012 වසරේදී සිදු කරනු ලැබීය.
- මෙහිදී පාරිභෝගිකයන්ට සහනයක් වශයෙන් ටින්මාළු සඳහා උපරිම සිල්ලර මිලක් නියම කරන ලද අතර අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා 2015 වසරේ නියම කරන ලද විශේෂ ආනයන බද්ද (Levy) පහත දැමීම සඳහා ද වත්මන් රජය විසින් පියවර ගන්නා ලදී.

- ටින් මාළු ආනයනය පෙර වසර සමග සසඳන විට 2015 වසරේදී මෙට්‍රික් ටොන් 49.016 දක්වා වැඩි වී ඇති අතර එය පෙර වසර මෙන් දෙගුණයකි. ඒ හේතුවෙන් රුපියල් බිලියන 11.9 ක විදේශ විනිමය මෙරටින් ඉවතට ගලා ගොස් ඇත. ආනයනික ටින්මාළුවලට උපරිම සිල්ලර මලක් නියම කිරීමත් සමගම දේශීය ටින්මාළු නිශ්පාදනය සඳහා පිරිවැය ඉහළ අගයක පවතින බැවින් දේශිය ටින්මාළු නිශ්පාදකයන් පාඩු ලැබීම හා අලුතින් ආරම්භ කල ටින්මාළු කර්මාන්ත වැසීයන තත්ත්වයට පත්විය. එමනිසා දේශීය ටින්මාළු කර්මාන්තයේ නියුතු අය සඳහා මැකරල් මසුන් ආනයනය කිරීමට තීරුබදු සහනයක් ලබා දෙන ලදි.
- ඒ අනුව 2016.01.12 දින අංක 16/0093/725/003 දරන කැබිනට් පත්‍රිකාව මගින් රේගු සංකේතාංක 0303.54 වර්ගීකරණය වු මැකරල් මසුන් සඳහා වන ආනයන තීරුබදු සඳහා සහනයක් ලබා දෙන ලදි.
- එහෙත් එහිදී දේශීය ටින්මාළු කර්මාන්තකරුවන් මෙන්ම, එසේ නොවන ආනයනකරුවන්ද මැකරල් මසුන් සඳහා ලබාදුන් සහනය යටතේ මාළු ආනයනය කරන ලදි.
- ඒ අනුව දේශීය ධීවර කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා දේශීය ටින්මාළු නිශ්පාදන කර්මාන්තයේ නියුතු කර්මාන්තකරුවන්ට පමණක් මැකරල් මසුන් ආනයනය සඳහා ලබාදුන් බදු සහනය ලබාගත හැකි වන පරිදි 1992/74 දරන ගැසට් නිවේදනය මගින් මැකරල් මසුන් ආනයනය හා ටින්මාළු ආනයනය බලපත්‍ර පාලනයට යටත් කරන ලදි.
- එමගින්
    - දේශිය ධීවර කර්මාන්තය ආරක්ෂා කිරීම
    - දේශීය ටින්මාළු කර්මාන්තය ආරක්ෂා කිරිම
    - දේශීය වෙළඳපොළට ප්‍රමිතියෙන් තොර ටින්මාළු ආනයනය පාලනය කිරීම
    - ටින්මාළු මිල හා ආනයනය කරන ප්‍රමාණය පාලනය කිරීම යන කාරණා සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

- එහෙයින්, ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අති විශේෂ ගැසට් පත්‍ර අංක 1992/74 යන 2016.11.11 දිනැති නිකුත් කරන ලද අතර, අනුමැතිය සඳහා 2016.12.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර 2017.01.25 දින අනුමැතිය ලබා දී ඇත.

**අති විශේෂ ගැසට් අංක 1999/47 සහ 2016.12.30**

**මොටර් වාහන ආනයනයට අදාල රේගු සංකේතාංක සංශෝදනය සහ කෘත්‍රිම ලිහිසිකාරක ආනයනය බලපත්‍ර පාලයනයට යටත් කිරීම පිළිබද රෙගුලාසි**

**මෝටර් වාහන හා වාහන බඳ**

- 2017 වර්ෂයේ අයවැය යෝජනා අනුව, නව බදුකරණ ක්‍රියාවලියක් හඳුන්වා දීමත් සමග ආනයනය හා අපනයන පාලන රෙගුලාසි ප්‍රධාන වශයෙන් ආකාර 02කින් සංශෝධනය කරන ලදී.
- නව බදුකරණ ක්‍රියාවලිය සමග ආනයන පරිපාලනය පහසු කිරීම සඳහා වාහන සහ වාහන බඳ ආනයනයට අදාළ නව රේගු වර්ගීකරණ සංකේතාංක 16ක් හඳුන්වා දීම.
- මෙම නව රේගු වර්ගීකරණ සංකේතාංක, දෙමුහුන් වර්ගයේ වාහනවල එන්ජින් ධාරිතාව අනුව ද, විදුලි බලයෙන් ක්‍රියා කරන වාහනවල විදුලිය ලබා ගන්නා ආකාරය එනම්, සූර්යබලය හෝ වෙනත් විදුලි සැපයුම් ක්‍රමවේද අනුව නිර්මාණය කර ඇත. එයට අමතරව වාහන බඳෙහි සවි කර ඇති ආම්පන්න අනුව, වාහන බඳ සඳහා වෙනම රේගු වර්ගීකරණ සංකේතාංක නිර්මාණය කර ඇත.
- බවුසර්, ශීතාගාරික ට්‍රක්රථ ටැංකර් සහ අනෙකුත් භාණ්ඩ ප්‍රවාහනය කරන වාහනවල ආයු කාලය වසර 10ක් දක්වා දීර්ඝ කිරීම

**කෘත්‍රිම ලිහිසිකාරක**

- සංශෝධිත 1961 අංක 28 දරන ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත මගින් සියලුම ලිහිසිකාරක තෙල් සහ ලිහිසිකාරක (ස්වාභාවික හෝ කෘත්‍රිමව නිෂ්පාදනය කළ) ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හෝ ශ්‍රී ලංකාව තුළ බෙදාහැරීම බලයලත් පාර්ශ්වකරුවන් වෙත පමණක් පැවරීම මගින් පාලනය කර ඇත.
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2006.07.12 දිනැති අංක 1453/6 දරන ගැසට් නිවේදනය මගින් ලිහිසිකාරක ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම හෝ ශ්‍රී ලංකාව තුළ බෙදාහැරීම තෝරා ගත් පාර්ශ්වයන් 13ක් සඳහා පවරා ඇත. කෙසේ වෙතත්, කෘත්‍රිම ලිහිසිකාරක ආනයනය හා අපනයනය පාලන පනත යටතේ බලපත්‍ර පාලනයට ලක්කොට නැත. 3403 යටතට ගැනෙන මෙම ලිහිසිකාරක කෘත්‍රිම ලිහිසිකාරක ලෙස හැඳින්වුවත් ඒ සඳහාද ඛණිජ තෙල් නිෂ්පාදනම යොදා ගන්නා අතර නිෂ්පාදන ක්‍රියාවලිය පමණක් වෙනස් වේ.

- එම කෘත්‍රිම ලිහිසිකාරක පරිසර හිතකාමී නිෂ්පාදනයක් වන අතර එමනිසාම එහි ආනයනික තීරුබදු ප්‍රතිශතය සාපේක්ෂව පහළ මට්ටමක තබා ඇත. ඛනිජ තෙල් ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන ලිහිසිකාරක මෙරටට ආනයනය කරන්නන් විසින් තීරුබදු අඩුවීමේ සහනය ලබා ගැනීම සඳහා ඒවා කෘත්‍රිම ලිහිසිකාරක ලෙස සඳහන් කර රේගුවෙන් නිදහස් කරගනු ලබයි.
- ඊට අමතරව කෘත්‍රිම ලිහිසිකාරක බලපත්‍ර පාලයනයට යටත් නොවන බැවින්, ඛනිජ ආශ්‍රිත ලිහිසිකාරක ආනයනයට අවසර නොමැති පාර්ශ්වයන් පවා ඒවා කෘත්‍රිම ලිහිසිකාරක ලෙස සඳහන් කොට මෙරටට ආනයනය කිරීමට පෙලඹී ඇත.
- ඒ හේතුවෙන් ඛනිජ ආශ්‍රිත ලිහිසිකාරක ආනයනය මගින් රජයට ලැබිය යුතු ආදායම නොලැබී යාම මෙන්ම, නියමිත ප්‍රමිතියෙන් තොර ලිහිසිකාරක බහුලව වෙළඳ පොළට පැමිණීම ද සිදුවී ඇත. එමනිසා, කෘත්‍රිම ලිහිසිකාරක ආනයනය අපනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීමෙන් මෙවැනි අක්‍රමිකතා මග හරිමින් රජයේ ආදායම සහතික කිරීමට තීරණය කරන ලදී.
- ඒ අනුව, ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අංක 1999/47 සහ 2016.12.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කරන ලද අතර මෙම ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2016.12.31 දින ඉදිරිපත් කරන ලදි. ඒ සඳහා 2017.01.26 දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත.

## ආදායම් විශ්ලේෂණය - 2016

2016 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අදායම රුපියල් මිලියන 1100 වු අතර දෙපාර්තමේන්තුව 2016 වර්ෂය තුළදී රුපියල් මිලියන 1370ක ආදායමක් උපයා ගැනීමට සමත් විය. 2015 වර්ෂය හා සැසඳීමේදී ආදායම 25.8% කින් වැඩි වී ඇත. එය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

බලපත්‍ර ආදායම -රු1,370,847,281.23

මෙම බලපත්‍ර ආදායම තුළ අතිරේක ගාස්තු සහ සංශෝධන ගාස්තු ද ඇතුළත් වේ.

## I. ආදායම - 2016

ආදායම පිළිබඳ විස්තර වගුව අංක 08 මගින් ඉදිරිපත් කර ඇත.

වගුව අංක 08

| විස්තරය | 2015 සත්‍ය ආදායම රු. | 2016 අනුමත ඇස්තමේන්තුව රු. | 2016 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව රු. | 2016 සත්‍ය ආදායම රු. |
|---|---|---|---|---|
| ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 1,089,153,993 | 1,100,000,000 | - | 1,370,847,281 |

## වියදම් විශ්ලේෂණය - 2016

### I. පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම

2016 වර්ෂය සඳහා රුපියල් මිලියන 65.875ක් පුනරාවර්තන හා මූල ධන වියදම් සඳහා ප්‍රතිපාදනය කර ඇත. වියදම රුපියල් මිලියන 59.66 ක් දරා ඇත.එය මුළු ප්‍රතිපාදනයෙන් 91% ක් වේ. විස්තර පහත පරිදි දක්වා ඇත.

ශීර්ෂ අංකය : 296
අමාත්‍යාංශය : සංවර්ධන උපාය මාර්ග හා අන්තර්ජාතික වෙළඳ
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය : 01
ව්‍යාපෘතිය : 01

වගුව අංක 09

| විස්තරය | 2015 සත්‍ය වියදම රුපියල් | 2016 අනුමත ඇස්තමේන්තුව රුපියල් | 2016 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2016 සත්‍ය වියදම රු. | ප්‍රතිපාදන උපයෝජනය % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | | | | | |
| පෞද්ගලික පඩි | 39,284,605 | 41,950,000 | 41,950,000 | 40,025,561 | 95% |
| වෙනත් පුනරාවර්තන | 15,106,544 | 18,075,000 | 17,881,000 | 16,294,599 | 91% |
| පුනරාවර්තන වියදම් එකතුව | **54,391,149** | **60,025,000** | **59,831,000** | **56,320,161** | **94%** |

| මූලධන | | | | | |
|---|---|---|---|---|---|
| 2001 - ගොඩනැගිලි ඉදිකිරීම් | - | - | - | - | - |
| 2003 - වාහන | 16,216 | 250,000 | 351,000 | 338,756 | 96% |
| 2102 - ලී බඩු හා කාර්යාල උපකරණ | 2,331,252 | 5,000,000 | 5,000,000 | 2,321,528 | 46% |
| 2401 - පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 308,000 | 600,000 | 693,000 | 679,894 | 98% |
| මූලධන වියදම් එකතුව | **2,655,468** | **5,850,000** | **6,044,000** | **3,340,178** | **55%** |
| මුළු එකතුව | **57,046,617** | **65,875,000** | **65,875,000** | **59,660,338** | **91%** |

## II. මූල්‍ය ප්‍රභවයන්

ඒකාබද්ධ අරමුදල මගින් දේශීය අරමුදල් යටතේ වෙන් කර දුන් මුදල් වියදම් කිරීමේදී කාර්යක්ෂමව හා ඵලදායීව වියදම් කිරීමට පියවර ගෙන ඇත.(වගුව අංක 10)

වගුව අංක 10

| විස්තරය | 2015 සත්‍ය වියදම රු. | 2016 අනුමත ඇස්තමේන්තුව රු. | 2016 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2016 සත්‍ය වියදම රු. |
|---|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල 11 - දේශීය අරමුදල් | 57,046,616.00 | 65,875,000.00 | 65,875,000.00 | 59,660,338.39 |
| මුළු වියදම | **57,046,616.00** | **65,875,000.00** | **65,875,000.00** | **59,660,338.39** |


## ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2016

දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 59ක් වියදම් කර රුපියල් මිලියන 1370ක ආදායමක් උපයා ඇත. එය වගුවකින් දක්වා ඇත.(වගුව අංක 11). මාසිකව ආදායම් වියදම් සාරාංශය පහතින් දැක්වේ.

වගුව අංක 11

| Month | Revenue | Expenditure |
|---|---|---|
| January | 115,368,345.37 | **4,593,953.14** |
| February | 80,768,448.15 | 4,411,098.56 |
| March | 106,526,814.36 | 4,763,535.43 |
| April | 119,322,762.46 | 4,804,437.34 |
| May | 98,170,125.13 | 4,634,013.02 |
| June | 98,322,458.53 | 4,856,921.30 |
| July | 98,193,819.16 | 4,463,009.45 |
| August | 137,281,230.76 | 4,496,721.70 |
| September | 125,763,491.81 | 4,923,605.99 |
| October | 134,070,446.44 | 4,763,142.56 |
| November | 95,155,721.07 | 4,847,103.96 |
| December | 161,903,618.02 | 8,102,795.94 |
| **Total** | **1,370,847,281.26** | **59,660,338.39** |

## ආදායම් හා වියදම් විශ්ලේෂණය - 2016




## පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සහ ලැබු අදායම

### පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

වගුව අංක 12

| | | | | | |
|---|---|---|---|---|---|
| ඖෂධ | 1823 | 2104 | 2500 | 2732 | 2,450 |
| වාහන | 1606 | 1288 | 958 | 739 | 797 |
| රසායන ද්‍රව්‍ය | 3767 | 4301 | 4339 | 3844 | 3,684 |
| විදුලි සංදේශ උපකරණ හ වෙනත් | 3468 | 3406 | 3523 | 4338 | 4,399 |
| විවිධ ආනයන හා අපනයන | 934 | 1427 | 2148 | 3274 | 4,168 |


### පසුගිය වසර පහ තුළ එක් එක් ඒකක මගින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව



## පසුගිය වසර 5 තුළඉපැයු බලපත්‍ර ආදායම

වගුව අංක 13

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 98,973,707 | 83,036,455 | 124,551,191 | 165,323,691 | 209,568,743.70 |
| වාහන | 141,991,581 | 125,202,590 | 159,721,793 | 311,027,758 | 293,250,180.66 |
| රසායන ද්‍රව්‍ය | 220,405,559 | 190,727,940 | 298,927,118 | 248,677,073 | 310,511,640.29 |
| විදුලි සංදේශ උපකරණ හ වෙනත් | 39,543,218 | 46,973,837 | 57,901,028 | 262,610,141 | 422,736,764.24 |
| විවිධ ආනයන හා අපනයන | 11,757,369 | 12,059,178 | 28,414,399 | 94,895,008 | 122,142,866.85 |
| ප්‍රතිපත්ති | | | | 6,620,319 | 12,244,795.95 |
| වෙනත් | | | | | 392,289.57 |
| එකතුව | **512,671,434** | **458,000,000** | **669,515,529** | **1,089,153,990** | **1,370,847,281.26** |



### පසුගිය වසර 5 තුළ ආදායම සහ බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

ගත වූ වසර 5 තුළ එක් එක් අංශ විසින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සහ ලැබූ ආදායම ඉහත පරිදි පෙන්වා දිය හැකිය. ඒ අනුව සමහර ඒකකවල නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවේ පහත බැසීමක් පසුගිය වර්ෂය තුළ දක්නට ලැබෙන නමුත් බලපත්‍ර ආදායම ඉහළ යාමක් පෙන්වයි. මේ සඳහා මූලික හේතුව ලෙස පසුගිය වර්ෂය තුළ අමෙරිකන් ඩොලරය හමුවේ රුපියල අවප්‍රමාණය වීම දැක්විය හැකිය.

### ඖෂධ - ඒකක 1

2016 වර්ෂයේ දී 2015 වසරට වඩා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව යම් තරමකින් පහත ගොස් ඇති නමුත් ආදායම ඉතා ඉහළ තලයකට පැමිණ ඇත. ඒ සඳහා ඉහත සඳහන් රුපියල අවප්‍රමාණය වීම සහ 2016 වර්ෂයේදී ඖෂධ සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වේ යැයි සිතා සමූහ බලපත්‍ර විශාල ප්‍රමාණයක් ලබා ගැනීම හේතු විය හැකිය.

### වාහන - ඒකක 2

2015 වර්ෂය දක්වා පාවිච්චි කරන ලද වාහන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවේ පහත යාමක් දක්නට ලැබුණත් 2016 වර්ෂයේ සුළු ඉහළ යාමක් දක්නට ලැබේ. 2014 වර්ෂය හා සසඳන විට පසුගිය වර්ෂ දෙක තුළ බලපත්‍ර ආදායම ඉහළ මට්ටමක පවතී. මේ සඳහා 2015 ජුනි මස 18 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1919/49 මගින් බලපත්‍ර අදායම් සංශෝධනය කිරීමත් එම ගැසට් පත්‍රය 2016 පෙබරවාරි 11 වන දින නැවත සංශෝධනය වීමත් හේතු වී ඇත.

### රසායන ද්‍රව්‍ය - ඒකක 3

2014 වර්ෂය රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා වැඩිම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද හා එමගින් වැඩිම ආදායමක් උපයන ලද වර්ෂය ලෙස වාර්තාගත වුවද, 2015 එම බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම, ආදායමද පහළ ගොස් ඇත. 2016 වර්ෂයේදීද නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව පහත ගියත් ආදායම ඉහල ගොස් ඇත. රසායනික ද්‍රව්‍ය අතරින් ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමුඛත්වයක් ගන්නා අතර එය රටේ නිෂ්පාදන ක්‍රියාවලියේදී සුලභව යොදා ගනී. 2015 හා 2016 වර්ෂවලදී රටේ ආර්ථිකයේ නිෂ්පාදන අංශයේ අඩු ප්‍රසාරණයක් පෙන්වා තිබීම රසායනික ද්‍රව්‍ය ආනයනය කෙරෙහි බලපෑම් කර ඇත.

### විදුලි සංදේශ උපකරණ හා වෙනත් - ඒකක 4

විදුලි සංදේශ උපාංගයන් පිළිබඳ සැලකීමේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම, ඉන් උපයන ලද ආදායමෙහිද ශීඝ්‍ර වර්ධනයක් පෙන්වා ඇත. සන්නිවේදන උපාංග ආනයනයේදී ජංගම දූරකථන ආනයනයට ප්‍රමුඛත්වයක් ලැබී ඇත. 2014 හා 2015 වර්ෂවල සන්නිවේදන ක්ෂේත්‍රයේ වාර්තාගත වර්ධනයක් පෙන්වා ඇති අතර, එම වසර 2 තුළ මහා පරිමාණ ව්‍යාපෘති රැසක්ද

ක්‍රියාත්මක වී ඇත. සන්නිවේදන උපකරණ හා ජංගම දුරකථන වැනි ආනයනයන් 2016 වර්ෂය තුළ වැඩි වී ඇත.

## විවිධ ආනයන හා අපනයන - ඒකක 5

විවිධ ආනයන සහ ව්‍යාපෘති සඳහා වන සංනිවේදන උපකරණ ආනයනය ඉහළ යාම නිසා ඒකක 5 විසින් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ඉතා වේගයෙන් ඉහළ ගොස් ඇති අතර ආදායමද පසුගිය වර්ෂ කිහිපය තුළ ඉහල වර්ධනයක් දක්නට ඇත.

## ප්‍රතිපත්ති අංශය

ආනයන හා අපනයන පාලන පනත යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සතු කාර්ය භාරය තුළ නෛතික පසුබිම ආරක්ෂා කරමින් ද අදාල රෙගුලාසි පනවමින්ද සංශෝදනය කරමින්ද දැනටමත් පනවා ඇති සහ පැනවීමට යෝජිත රෙගුලාසි පිළිබද අධ්‍යයනය කරමින්ද කටයුතු කරන අංශයවේ.


ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ අංශයක් වන ප්‍රතිපත්ති අංශයේ මුඛ්‍යය කාර්ය වන්නේ රජයේ අවශ්‍යතාවය මත කාලීනව පැනවිය යුතු රෙගුලාසි සම්පාදනය කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමත් ඒවා බලපත්‍ර පාලනයට ලක් කිරීමත් වේ.

එයට අමතරව ආනයන අපනයන කටයුතු වලදී එහි නිරතවන්නන් මුහුණදෙන විවිධ ගැටළු නිරාකරණය කිරීම සඳහා මැදිහත්වීම මගින් පහසුකම් සැළසීමත් ඒවාට අදාලව වාණිජ බැංකු වලට හා රේගු දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දීමත් මෙම අංශය මගින් සිදු කරයි.

ආනයන ප්‍රතිපත්ති රාමුන්ද ක්‍රියාකාරී සැළසුම්, ප්‍රගති වාර්තා සහ කාර්යසාධන වාර්තා නියමිත කාල වකවානු තුළ මෙම අංශය මගින් සකස් කර නිකුත් කරනු ලබයි.

අංක 1917/24 දරන 2015.06.03 දිනැති ගැසට් පත්‍රය අනුව ප්‍රතිපත්ති අංශය විසින් ප්‍රතිපත්තිමය අනුමැති ලබා දීම සඳහා ගාස්තු අය කිරීම ආරම්භ කර ඇත. 2016 වර්ෂය තුළ ප්‍රතිපත්ති අංශය අනුමැති ලබාදීම මගින් ලද ආදායම රුපියල් මිලියන 12.2 ක් ලෙස වාර්තා වී ඇත.

## සංවිධාන සටහන


Controller General
Controller
Assistant Controller Unit 1
Assistant Controller Unit 2
Assistant Controller Unit 3
Assistant Controller Unit 4
Assistant Controller Unit 5
Accountant
Assistant Controller Policy
Assistant Controller Adminstration
Internal Auditor
Information Technology Officer
Administrative Officer
Unit Head
Chief Management Assistant
Management Assistants 09
Management Assistants 06
Management Assistants 10
Management Assistants 07
Management Assistants 09
Management Assistants 06
Budget Assistant 01
Development Officers 05
Development Officers 02
Information Assistants
Management Assistants 05
Translators 02
Management Assistants 02
Management Assistants 02
Office Employee Service 01
Office Employee Service 05
Drivers 06